# කාර්යසාධන වාර්තාව

# 2
# 0
# 2
# 2

සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

# 2022 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

ආයතනයේ නම: **සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව**

වැය ශීර්ෂ අංකය **:243**

## අන්තර්ගතය

**පරිච්ඡේදය**


1. ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය
2. ප්‍රගතිය හා ඉදිරි දැක්ම
3. වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය
4. කාර්ය සාධන දර්ශක
5. තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය
6. මානව සම්පත් පැතිකඩ
7. අනුකූලතා වාර්තාව

## 01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

### 1.1 හැඳින්වීම :

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය හා ක්ෂුද්‍රමූල්‍ය අංශය නගා සිටුවීමේ අරමුණ පෙරදැරිකර ගනිමින් 2005 ජනවාරි මස 01 වන දින මෙම දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදී. විධායක නිලධාරීන් 17 දෙනෙකු ප්‍රමුඛ 49 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයකින් සමන්විත වේ.

#### 1.1.1 ප්‍රාථමික සංවර්ධන අංශය

රජයේ සංවර්ධන සහනාධාර ක්‍රම ක්‍රියාත්මක කිරීම, ප්‍රාථමික ආර්ථික සංවර්ධනය නංවාලීම, නැඟී එන ආර්ථික කටයුතු සම්බන්ධ ප්‍රතිපත්ති සකස් කිරීම යනාදී නියාමන කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.

#### 1.1.2 ක්ෂුද්‍රමූල්‍ය සංවර්ධන අංශය

දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා ලොව පුරා පිළිගත් ක්‍රමවේදයක් වූ ක්ෂුද්‍රමූල්‍යනය පසුගිය දශක කිහිපය පුරා ලංකාව තුළ ද ක්‍රියාත්මක කර ඇත. ශ්‍රී ලංකාවේ පුළුල් භූගෝලීය ප්‍රදේශයක් පුරා ක්ෂුද්‍රමූල්‍ය සේවාවන් ව්‍යාප්තව පැවතුන ද ග්‍රාමීය ප්‍රදේශවල වාණිජ බැංකු හා රාජ්‍ය නොවන සංවිධාන ඇතුළු පෞද්ගලික අංශයේ ක්‍රියාකාරීත්වය අවම මට්ටමක පවතී. ක්ෂුද්‍රමූල්‍යනය, මධ්‍යම ආදායම්ලාභී කුටුම්භයන් හි ආදායම් හා වත්කම් වැඩි දියුණු කිරීමටත්, අඩු ආදායම්ලාභී කුටුම්භයන් හි පරිභෝජන වියදම් වැඩි කිරීමටත්, ඔවුන්ගේ ඉතිරි කිරීමේ පුරුද්ද වර්ධනය කිරීමටත්, සියළුම ආදායම් බාණ්ඩයන් හි පරිභෝජනය සුමට කිරීමේ මෙවලමක් ලෙසත්, කාන්තාවන්ගේ සාමාජීය හා ආර්ථික තත්ත්වය වැඩි දියුණු කිරීමටත් දායක වී ඇත.

#### 1.1.3 සුළු හා මධ්‍ය පරිමාණ සංවර්ධන අංශය

ශ්‍රී ලංකා රජයේ සමස්ත ප්‍රතිපත්ති රාමුව තුළ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය වැදගත් උපායමාර්ගික අංශය ලෙස හඳුනාගෙන ඇත. එම අංශය මඟින් ආර්ථික වර්ධනය, ප්‍රාදේශීය සංවර්ධනය, රැකියා අවස්ථා උත්පාදනය හා දරිද්‍රතාවය තුරන් කිරීමට විශාල දායකත්වයක් ලබා දෙයි. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය මඟින් ලංකාවේ සමස්ත ව්‍යවසායන්ගෙන් සියයට 75 ක් ද, සේවා නියුක්තියෙන් සියයට 45 ක් ද, දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 52 ක ට ද දායකත්වය සපයන බැවින් එය මනාව ලාංකික ආර්ථිකය තුළ පිළිඹිබු වේ.

#### 1.1.4 සංවර්ධන මූල්‍ය පිළිබඳ ක්‍රමෝපාය සැලසුම්

නිෂ්පාදකයින්ට තම වගා බිමේ දී ලබා දෙන මිල තහවුරු කරන අතරම ස්ථාවර වෙළඳපොල මිලක් ලබා දීම සඳහා අතිරික්ත අස්වනු කළමනාකරණය කර කුඩා හා මධ්‍ය පරිමාණ ගොවීන් සහ අනෙකුත් වෙළඳපොල සාධකයන් කෙරෙහි අවධානය යොමු කරමින් සැපයුම් අංශය සහ ඉල්ලුම් පාර්ශවය තුලනය කිරීම.

ජාතික ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට වටිනා දායකත්වයක් ලබා දීමේ විභවයන් ඇති කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් දිරිමත් කිරීම හා නව ව්‍යවසායකයින් හඳුනා ගැනීම අරමුණු කරගෙන මෙම දෙපාර්තමේන්තුවේ මැදිහත් වීම යටතේ සහනදායී ණය, භාණ්ඩාගාර ඇපකර සහ තාක්ෂණික සහායන් සැපයීම ඇතුළු විවිධ රාජ්‍ය අනුග්‍රහයන් ලබා දීම සිදු කරනු ලබයි.

## 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර හා අරමුණු

**දැක්ම :**

"සංවර්ධන මූල්‍ය සඳහා අවශ්‍ය පහසුකම් සපයන රජයේ ප්‍රමුඛ නියෝජිත ආයතනය බවට පත්වීම".

**මෙහෙවර :**

"අදාළ පාර්ශවයන්ගේ මැදිහත්වීම ඇතිව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය සඳහා අවශ්‍ය මූල්‍ය සම්පත් යෙදවීම හා ප්‍රාථමික ව්‍යවසාය අංශය මූල්‍යනය හා ඊට අදාළ ප්‍රතිපත්ති හා ක්‍රමෝපායන් සැකසීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම""

**අරමුණ :**

"සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය හා ක්ෂුද්‍රමූල්‍ය අංශය නගා සිටුවීම"

## 1.3 ප්‍රධාන කාර්යයන්

1.3.1 ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයන්හි සංවර්ධනය උදෙසා අවශ්‍ය ප්‍රතිපත්ති, ක්‍රමෝපායන් හා වැඩසටහන් සැකසීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.

1.3.2 වෙළඳපොල දත්ත විශ්ලේෂණය කර ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයන්හි දියුණුවට බලපාන ප්‍රධාන ගැටළු හඳුනා ගැනීම සහ ඒ සඳහා අවශ්‍ය ඵලදායී විසඳුම් ලබා දීම.

1.3.3 ආර්ථික සංවර්ධනය උදෙසා රජය මඟින් ක්‍රියාත්මක කරනු ලබන සහනාධාර වැඩසටහන්වල ප්‍රගතිය සමාලෝචනය කිරීම සහ ඊට අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.

1.3.4 වෙළඳපොල අවශ්‍යතාවයන් අනුව, බැංකු, රක්ෂණය, ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය සහ මූල්‍ය අංශයන්ට අදාළ නීති බලගැන්වීම සඳහා අවශ්‍ය සහසුකම් සැලසීම.

1.3.5 ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය, බැංකු, මූල්‍ය වෙළඳපොල සහ අනෙකුත් අංශයන්ට අදාළව රජයේ වාර්ෂික අයවැය සැකසීමේ ක්‍රියාවලියට අවශ්‍ය පහසුකම් සැපයීම.


1.3.6 ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය, ප්‍රාථමික ව්‍යවසාය අංශය සහ අනෙකුත් අංශයන්ට අදාළ අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම සහ විදේශ ණය ආධාර මත ක්‍රියාත්මක කෙරෙන ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම.

1.3.7 ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය පිළිබඳව කෘෂිකාර්මික, කාර්මික, හා සේවා යන අංශ යටතේ දත්ත රැස් කිරීම හා ඒවා විශ්ලේෂණය කිරීම මගින් පවතින දුෂ්කරතා හා ප්‍රතිපත්තිමය මැදිහත්වීම් හඳුනා ගැනීම.

1.3.8 රජයේ අනුග්‍රහය මත ක්‍රියාත්මක කරනු ලබන මූල්‍ය සහන යෝජනා ක්‍රම පිළිබඳව සොයා බැලීම.

1.3.9 රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයන් හි සංවර්ධන ව්‍යාපෘති සඳහා දේශීය බැංකු හා මූල්‍ය පහසුකම් ලබා දීම.

## 1.4 සංවිධාන සටහන




- නි.අ – නියෝජ්‍ය අධ්‍යක්ෂ
- ස.අ – සහකාර අධ්‍යක්ෂ
- තො.ස.හා තා.නි. - තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ නිලධාරී
- ස.නි.˚ සංවර්ධන නිලධාරී
- ප්‍ර.ක.සේ.නි.˚ ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී
- තො.ස.හා තා. ස. - තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ සහකාර
- ක.සේ.නි. - කළමනාකරණ සේවා නිලධාරී
- ක.ස. - කළමනාකරණ සහකාර
- රිය - රියදුරු
- කා.කා.ස.˚ කාර්යාල කාර්ය සහායක

### 1.5. අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

1. ප්‍රාථමික සංවර්ධන අංශය
2. ක්ෂුද්‍රමූල්‍ය සංවර්ධන අංශය
3. සුළු හා මධ්‍ය පරිමාණ සංවර්ධන අංශය
4. සංවර්ධන මූල්‍ය පිළිබඳ ක්‍රමෝපාය සැලසුම්
5. විශේෂ කාර්යයන්/ව්‍යාපෘති

### 1.6 දෙපාර්තමේන්තු අරමුදල්

අදාළ නොවේ.

### 1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්)

| ව්‍යාපෘතියේ නම | දායක නියෝජිතායතනය | ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම (රු. මිලියන) | ව්‍යාපෘති කාල සීමාව |
|---|---|---|---|
| සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රමය | ආසියානු සංවර්ධන බැංකුව | 69,194 | 2016-2024 |

## 02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

**පසුබිම**

ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය, රටකට කලාපීය වශයෙන් මෙන්ම සමාජ ආර්ථික වශයෙන් සමබර ආර්ථික වර්ධනයකට වැදගත් වේ. එය ආර්ථිකයට නව නිපුනතා හා අදහස් මනාව සැපයීමට තුලින් වෙළඳපොළ වඩාත් ගතික බවට පත් කරයි. ඒ අනුව, අවශ්‍ය ප්‍රතිපත්ති හා උපායමාර්ග සම්පාදනය කරමින් විශේෂයෙන්ම අදාළ පාර්ශවකරුවන් සමඟ මැදිහත්වීම තුලින් ප්‍රාථමික අංශය සංවර්ධනය සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් සැපයීම සඳහා සහය ලබාදෙමින් දෙපාර්තමේන්තුව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට පහසුකම් සපයයි.

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය මුහුණ දෙනු ලබන පොදු අභියෝග වන දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොළ වෙත ප්‍රවේශ වීමේ අපහසුතාව, මූල්‍ය ප්‍රතිපාදන සොයාගැනීමේ අපහසුතාව සහ මූල්‍ය ප්‍රවාහ කළමනාකරණයන්ට අමතරව කොවිඩ් 19 වසංගත තත්ත්වය හා පවතින ආර්ථික අර්බුදය ද මෙම අංශය කෙරේ ඉමහත් බලපෑමක් ඇති කරන ලදී. විදුලිබලය ඇනහිටීම හා ඉන්ධන හිඟතාවය මෙම තත්ත්වය තවදුරටත් වර්ධනය වූ අතර ආයතන කඩා වැටීම හා පවත්වාගෙනයාමේ අපහසුතාව මෙන්ම එම ආයතනවල අනාගතය පිළිබඳ අවිනිශ්චිතතාවය ද ඇති විය. පවතින උග්‍ර මූල්‍ය අර්බුදය හමුවේ විදේශ ආධාර මගින් හෝ රාජ්‍ය අයවැය මගින් හෝ පොලී සහනාධාර සහිත මූල්‍ය සහනාධාර

ලබාදීමට රජයට නොහැකි විය. කෙසේවෙතත්, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය විසින් ආර්ථිකයට කරනු ලබන දායකත්වයේ වැදගත්කම සලකා බලා වෙනත් විකල්ප මූල්‍ය ප්‍රතිපාදන තුලින් මූල්‍යමය මෙන්ම මූල්‍යමය නොවන පහසුකම් සැලසීමේ ක්‍රමවේදයක් හඳුනාගැනීමේ අවශ්‍යතාවක් ඇත.

- **සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රමය**

  ආසියානු සංවර්ධන බැංකු අරමුදල් යටතේ ක්‍රියාත්මක සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රමය යටතේ ක්‍රියාත්මක සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය සංරචකයේ අවශ්‍යතාවය මත 2022 වර්ෂයේ දී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 692 ක් වෙත ලියාපදිංචි වාණිජ බැංකු 13 ක් හරහා මුළු ආයෝජන ණය වශයෙන් රු. මිලියන 5,700 ක් ලබාදෙන ලදී. විශේෂයෙන්, රු. මිලියන 251 ක් කාන්තා ව්‍යවසායකත්ව මූල්‍ය ප්‍රදානය ලෙස ආයෝජන ණය සමඟ මුසුකරමින් කාන්තා ව්‍යවසායකයින් 343 දෙනෙකු වෙත ලබාදෙන ලදී. තවද, කුඩා තේ වතු හිමියන් සඳහා වන ණය යෝජනා ක්‍රමය යටතේ කුඩා තේ වතු හිමියන් 982 දෙනෙකු වෙත රු. මිලියන 1,515 ක් තේ අලුතින් වගා කිරීම, නැවත වගා කිරීම, පාළු සිටුවීම, ජල සම්පාදනය, පැළ තවාන් සංවර්ධනය හා යාන්ත්‍රිකරණය ආදී කටයුතු සඳහා ලබාදුන් අතර එයින් කුඩා තේ වතු හිමියන් 660 දෙනෙකු වෙත තේ අලුතින් වගා කිරීම හා නැවත වගා කිරීම වෙනුවෙන් රු. මිලියන 86 ක් වටිනා දිළිඳුකම අඩු කිරීම සඳහා වන ජපන් අරමුදල් ප්‍රදානය (Japan Fund for Poverty Reduction – JFPR) හිමි විය.

  එපමණක් නොව, කොවිඩ් බලපෑමට ලක් වූ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර 3,842 ක් සඳහා ඔවුන්ගේ ව්‍යාපාර යළි නගා සිටුවීම වෙනුවෙන් කාරක ප්‍රාග්ධන ණය ලෙස රු. මිලියන 19,348 කට ආසන්න මුදලක් කාරක ප්‍රාග්ධන ණය යෝජනා ක්‍රමය යටතේ 2022 වර්ෂය අවසන් වන විට ලබා දෙන ලදී. තවද, ආසියානු සංවර්ධන බැංකුවේ එකඟතාවය පරිදි ආර්ථික පසුබෑම හේතුවෙන් බලපෑමට ලක්ව ඇති ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වෙත කාරක ප්‍රාග්ධන පහසුකම් සැපයීම වෙනුවෙන් ඇ. ඩොලර් මිලියන 13.5 ක මුදලක් හදිසි ප්‍රතිචාර ණය සංරචකය යටතේ අතිරේක ප්‍රතිපාදනයක් ලෙස ලබාදෙන ලදී.

- **පොහොර භාවිත ප්‍රතිපත්තිය 70 : 30 ලෙස වෙනස්වීම**

  කෘෂිකාර්මික ක්ෂේත්‍රය මඟින් ආර්ථිකයට දක්වන දායකත්වය පිළිබඳව සැලකිල්ලට ගනිමින්, එම ක්ෂේත්‍රයේ පැවැත්ම සඳහා වී වගාව හා අනෙකුත් බෝග වගාවන් වෙනුවෙන් රජයේ පොහොර සහනාධාර ප්‍රතිපත්තියට සහයදීමට පියවර ගන්නා ලදී. අස්වැන්නෙන් 37% ක අඩුවීම සලකා බලා, මීට පෙර පැවති 100% කාබනික පොහොර භාවිතා කිරීමේ තීරණය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශය මත, 2022/23 මහ කන්නයේ සිට 70% රසායනික පොහොර හා 30% ක කාබනික පොහොර භාවිතා කිරීමේ දෙමුහුම් සංකල්පය වෙත මාරුවී ඇත.

  රට තුල පැවති විදේශ විනිමය අර්බුදය හේතුවෙන්, 2021/22 මහකන්නයේදී මෙන්ම 2022 යල කන්නයේදී රසායනික පොහොර ප්‍රමාණවත් පරිදි සැපයීම තහවුරු කල නොහැකි විය. කෙසේ වෙතත්, පූර්ණ සහනාධාරයක් යටතේ කොම්පෝස්ට්, දියර පොහොර, ජෛව රසායනික පොහොර සහ විශේෂ ආකාරයෙන් සපයන ලද පරිසර හිතකාමී පොහොරවලට අමතරව, 2022 යල කන්නය සඳහා ඉන්දියානු රේඛීය ණය පහසුකම යටතේ, ඇමෙරිකානු ඩොලර් මිලියන 55ක් වටිනා යූරියා පොහොර මෙ.ටො. 55,000ක්

ආනයනය කිරීමට රජයට හැකිවිය. 2022/23 මහ කන්නයේ සිට නව 70:30 දෙමුහුම් පොහොර භාවිතා කිරීම යටතේ, බහුපාර්ශවික ආයතනවල මූල්‍ය දායකත්වය ඇතිව යූරියා මෙ.ටො. 105,000ක් හා මියුරේට් ඔෆ් පොටෑෂ් (MOP) මෙ. ටො. 40,000ක් ආනයනය කිරීමට හැකිවිය. ගොවීන්ට MOP පොහොර මිලදීගැනීමේ හැකියාව සහතික කිරීම සඳහා, හෙක්ටයාරයකට රු. 10,000 බැගින් උපරිම වශයෙන් හෙක්ටයාර දෙකක් සඳහා අදාල මුදල් ගොවීන්ගේ බැංකු ගිණුම් වෙත සෘජුවම තැන්පත් කිරීමට කටයුතු කරන ලදී. ඊට අමතරව, 2022/23 මහ කන්නය සඳහා නව දෙමුහුම් පොහොර භාවිත ප්‍රතිපත්තිය මත, දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල අධීක්ෂණය යටතේ රු. මිලියන 16,000ක් වටිනා කාබනික පොහොර ප්‍රසම්පාදනය කර ගැනීමට කටයුතු කර ඇත.

2022 වර්ෂයේදී අනෙකුත් ක්ෂේත්‍ර භෝග සඳහා පොහොර සහනාධාර සැපයීමට කටයුතු නොකරන ලද අතර, පෞද්ගලික අංශය ඔවුන්ගේ පොහොර අවශ්‍යතාවය සපුරාලීමට කටයුතු කර ඇත.

කුඩා තේ වතු හිමියන්ට හා බඩඉරිඟු ගොවීන්ට ඔවුන්ගේ පොහොර අවශ්‍යතාවය සපුරාලීම සඳහා රජය විසින් ආනයනය කරන ලද පොහොර තොග පිළිවෙලින් මෙ.ටො. 3,105ක් හා මෙ.ටො. 8,770ක්, ප්‍රමාණවත් කි.ලෝ. ග්‍රෑම් 50 ක බෑගයක් රු. 15,000 ක බැගින් වූ මුදලකට ලබාදීමට කටයුතු කරන ලදී.

- **කාබනික පොහොර නිෂ්පාදනය ප්‍රවර්ධනය සඳහා මූල්‍යාධාර**

"දේශගුණික විපර්යාස සඳහා තිරසර විසඳුම් සහිත හරිත සාමාජ ආර්ථික රටාවක් කරා" යන රජයේ ප්‍රතිපත්තිය අනුව කාබනික පොහොර, පළිබෝධනාශක හා වල්නාශක නිෂ්පාදකයින් සඳහා විශේෂ ණය යෝජනා ක්‍රමයක් ලංකා බැංකුව, මහජන බැංකුව හා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සමඟ එක්ව හඳුන්වාදෙන ලදී.

ඒ අනුව, ඉහත බැංකු හරහා සුදුසුකම්ලත් දේශීය කාබනික පොහොර, පළිබෝධනාශක හා වල්නාශක නිෂ්පාදකයින් 25 දෙනකු වෙත, රු. මිලියන 162ක් වටිනා ණය ප්‍රධානය කොට ඇති අතර, ඒ සඳහා පොලී සහනාධාරය මහා භාණ්ඩාගාරය විසින් ගෙවනු ලැබේ. 2021 හා 2022 වර්ෂයට අදාලව රු. මිලියන 4.5 ක මුදලක් මෙම වැඩසටහන යටතේ දැනටමත් පොලී සහනාධාර වශයෙන් ගෙවා ඇත.

ශ්‍රී ලංකාවේ 2021 වසරේ දී මෙ.ටො. මිලියන 5.15 ක් ව පැවති වී නිෂ්පාදනය 2022 දී මෙ.ටො. මිලියන 3.39 ක් දක්වා වූ ප්‍රමාණයකට අඩු වූ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් පෞද්ගලික අංශයේ වී මෝල් හිමියන් විසින් මිල දී ගන්නා ලද වී ප්‍රමාණය ද අඩු විය. එමනිසා, 2022 දී රාජ්‍ය සහ පෞද්ගලික බැංකු මගින් වී මිල දී ගැනීම සඳහා පෞද්ගලික අංශයට ලබාදෙන ලද ණය පහසුකම් සංඛ්‍යාව සහ ණය වටිනාකම් 2021 වසරට සාපේක්ෂව පිළිවෙළින් 32% කි න් සහ 8% කි න් අඩු වී ඇත.

- **ඇමරිකානු ඩොලර් මිලියන 1,000ක ඉන්දියානු ණය පහසුකම ක්‍රියාත්මක කිරීම**

බැංකු පද්ධතියේ හා වෙළඳපොළ තුළ පැවති විදේශ විනිමය හිඟතාවය නිසා ණයවර ලිපි විවෘත කිරීමේදී දුෂ්කරතා රැසකට මුහුණ දීමට සිදු වූ ශ්‍රී ලංකාවේ ආනයනකරුවන්ට පහසුකම් සැලසීමේ අරමුණින් ඉන්දියාවෙන් අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය කිරීම සඳහා

ඇමරිකානු ඩොලර් මිලියන (ඇ.ඩො.මි.) 1,000ක ණය මුදලක් ලබා ගැනීමට 2022 මාර්තු 17 දින ශ්‍රී ලංකා රජය සහ ඉන්දියානු රාජ්‍ය බැංකුව අතර ණය පහසුකම් ගිවිසුමකට එළඹීමට අත්සන් කරන ලදී. වරින්වර ඇතිවූ අවශ්‍යතාවයන් මත, ආනයනික භාණ්ඩ කාණ්ඩ අතර අරමුදල් වෙන් කිරීම කිහිපවරක් සංශෝධනය කරන ලදුව අවසාන වශයෙන් අත්‍යවශ්‍ය භාණ්ඩ සඳහා ඇ.ඩො. මිලියන 371ක්, ඖෂධ සඳහා ඇ.ඩො. මිලියන 235ක්, කාර්මික අමුද්‍රව්‍ය සඳහා ඇ.ඩො. මිලියන 194ක් සහ ඉන්ධන සඳහා ඇ.ඩො. මිලියන 200ක් ලෙස අරමුදල් වෙන් කරන ලදී. ඒ අනුව, වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය, මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය, කර්මාන්ත අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා රේගුව ඉන්දියානු ණය පහසුකම ක්‍රියාත්මක කිරීමේදී එක්ව කටයුතු කරනු ලබයි

| **කාණ්ඩය** | **වෙන් කළ ප්‍රමාණය (ඇ. ඩො. මි.) (අ)** | **අනුමත වටිනාකම (ඇ. ඩො. මි.) (ආ)** | **2022.12.31 දිනට ආනයනික භාණ්ඩවල වටිනාකම (ඇ. ඩො. මි.) (ඉ)** | **නිකුත් කළ ගෙවීම් නිර්දේශවල වටිනාකම (ඇ. ඩො. මි.) (ඊ)** | **ආනයනික ප්‍රතිශතය (%) ((ඉ/ආ)*100)** |
|---|---|---|---|---|---|
| අත්‍යාවශ්‍ය භාණ්ඩ | 371 | 196 | 75 | 73 | 38% |
| ඖෂධ | 235 | 130 | 44 | 33 | 34% |
| ඉන්ධන | 200 | 200 | 200 | 200 | 100% |
| කාර්මික අමුද්‍රව්‍ය | 194 | 64 | 26 | 22 | 41% |
| **එකතුව** | **1,000** | **590** | **345** | **328** | **58 %** |

මූලාශ්‍රය: ඉන්දියානු ණය පහසුකම් සම්බන්ධීකරණ ඒකකය

**මලර්මදි ගංගාදරන්**
**අධ්‍යක්ෂ ජනරාල්**

## 03 පරිච්ඡේදය - 2022 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

### 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

**2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

| අයවැය 2022 රු. | | සටහන | තත්‍ය 2022 රු. | - 2021 රු. | |
|---|---|---|---|---|---|
| - | **ආදායම් ලැබීම්** | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | ඒසීඒ-1 |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | ඒසීඒ-1 |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 20,277,341,570 | 36,391,751,969 | **ඒසීඒ-3** |
| - | තැන්පතු | | 52,476,765,810 | 91,525 | **ඒසීඒ-4** |
| - | අත්තිකාරම් ගිණුම් | | 3,007,786 | 4,597,091 | **ඒසීඒ-5** |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | | - | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **72,757,115,166** | **36,396,440,585** | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **72,757,115,166** | **36,396,440,585** | |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)** | | **52,476,626,035** | - | |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)** | | **20,280,489,131** | **36,396,440,585** | |
| | **අඩු කළා : වියදම්** | | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | - | - | |
| 48,382,665 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 48,003,735 | 40,101,482 | ඒසීඒ-2(ii) |
| 13,350,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 12,344,889 | 706,860,349 | ඒසීඒ-2(ii) |
| 20,897,671,985 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 20,272,915,111 | 35,291,279,934 | ඒසීඒ-2(ii) |
| - | පොළී ගෙවීම් | 8 | - | - | ඒසීඒ-2(ii) |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | - | ඒසීඒ-2(ii) |
| **20,959,404,650** | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **20,333,263,734** | **36,038,241,765** | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | **මූලධන වියදම්** | | | | |
| 300,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | **10** | 267,000 | 422,015 | |
| 10,500,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | **11** | 2,361,040 | 1,194,064 | |
| 1,109,358,314 | ප්‍රාග්ධන මාරුකිරීම් | **12** | 942,626,347 | 988,690,896 | **ඒසීඒ-2(ii)** |
| 13,535,000,000 | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | **13** | 11,354,796,347 | 18,000,832,439 | |
| 125,000 | හැකියා වර්ධනය | **14** | 81,926 | 139,491 | |
| 4,085,221,686 | වෙනත් මූලධන වියදම් | **15** | 6,559,086 | 7,377,278 | |
| **18,740,505,000** | **මුළු මූලධන වියදම් (උ)** | | **12,306,691,746** | **18,998,656,183** | |
| | තැන්පතු ගෙවීම් | | 36,218,057,375 | 503,282 | **ඒසීඒ-4** |
| | අත්තිකාරම් ගෙවීම් | | 2,238,788 | 5,307,115 | **ඒසීඒ-5** |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | | - | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | **36,220,296,163** | **5,810,397** | |
| | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | **68,860,251,643** | **55,042,708,345** | |
| - | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)** | | **(48,579,762,512)** | **(18,646,267,760)** | |
| | **අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය** | | **(48,579,762,512)** | **(18,646,267,760)** | **ඒසීඒ-7** |
| | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | | - | | **ඒසීඒ-3** |
| | | | **(48,579,762,512)** | **(18,646,267,760)** | |

## 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-පී

**2022 දෙසැම්බර් 31 දිනට**
**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

| | සටහන | තත්‍ය 2022 රු. | තත්‍ය 2021 රු. |
|---|---|---|---|
| <u>මූල්‍ය නොවන වත්කම්</u> | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසිඒ-6 | 1,715,350,080 | 1,713,683,520 |
| <u>මූල්‍ය වත්කම්</u> | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසිඒ-5/5(ඒ) | 6,888,379 | 7,657,377 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසිඒ-3 | - | - |
| මුළු වත්කම් | | **1,722,238,459** | **1,721,340,897** |
| <u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u> | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | (16,252,142,938) | 7,334,520 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 1,715,350,080 | 1,713,683,520 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසිඒ-5(බී) | | |
| <u>ජංගම වගකීම්</u> | | | |
| තැන්පතු ගිණුම් | ඒසිඒ-4 | 16,259,031,317 | 322,857 |
| අග්‍රිම ශේෂය | ඒසිඒ-3 | - | - |
| මුළු වගකීම් | | **1,722,238,459** | **1,714,006,377** |

පිටු අංක 6 සිට 27 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 28 සිට 29 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

..........................
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම :කේ.එම්.එම්.සිරිවර්ධන
තනතුර :ලේකම්,මුදල් අමාත්‍යාංශය
දිනය :
කේ.එම්.එම්. සිරිවර්ධන

..........................
ගණන්දීමේ නිලධාරි
නම :ගීතා විමලවීර
තනතුර :අධ්‍යක්ෂ ජනරාල්
දිනය :15.02.2023
ගීතා විමලවීර
අධ්‍යක්ෂ ජනරාල්

..........................
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :ඩබ්ලිව්.පී.බී.එස් අබේවර්ධන
දිනය : 15.
ඩබ්ලිව්.පී.බී.එස්. අබේවර්ධන
නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්)

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

## 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | තත්‍ය | |
|---|---|---|
| | **2022**<br>රු. | **2021**<br>රු. |
| <u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | - |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | | |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 6,440,483 | 2,174,249 |
| අග්‍රිම ලැබීම් | 20,277,341,570 | 36,391,751,969 |
| අත්තිකාරම් අයකර ගැනීම් | 2,400,749 | 2,477,557 |
| තැන්පතු ලැබීම් | 52,476,765,810 | 91,525 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **72,762,948,612** | **36,396,495,300** |
| <u>**අඩුකළා : මුදල් වැය කිරීම්**</u> | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 60,815,750 | 747,554,557 |
| සහනාධාර සහ මාරුකිරීම් | 20,215,046,597 | 35,216,913,485 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 52,476,626,035 | - |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | - | - |
| අත්තිකාරම් ගෙවීම් | 2,028,668 | 2,774,199 |
| තැන්පතු ගෙවීම් | 348,807 | 503,282 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **72,754,865,857** | **35,967,745,523** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | **8,082,755** | **428,749,777** |

| | | |
|---|---|---|
| <u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම් | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)** | **-** | **-** |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | 8,082,755 | 428,749,777 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **8,082,755** | **428,749,777** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඇ)-(ඉ)** | **(8,082,755)** | **(428,749,777)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | **0** | **-** |
| <u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | **-** | **-** |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | **-** | **-** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | **-** | **-** |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)** | **0** | **-** |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | **-** | **-** |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | **0** | **-** |

## 3.4 මූල්‍ය ප්‍රකාශන සටහන්

**වාර්තා කිරීමේ පදනම**

**1. වාර්තාකරණ කාලපරිච්ඡේදය**

2022 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

**2. මිනුම්කරණ පදනම**

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩි දියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩි දියුණු කළ මුදල් පදනම මත සිදු කරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

**3. ආදායම් හඳුනාගැනීම**

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේ දී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

**4. දේපල, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා ගැනීම**

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්ම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවල දී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

**5. දේපළ, පිරියත හා උපකරණ සංචිතය**

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම් වේ.

**6. මුදල් හා මුදල් සමාන දෑ**

2022 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

### 3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය.

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය (රු.) | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| අදාළ නොවේ | | | | | |

### 3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය.

රු. 000

| ප්‍රතිපාදන වර්ග | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 20,872,580,000 | 20,959,604,650 | 20,333,263,734 | 97 |
| ප්‍රාග්ධන | 18,740,505,000 | 18,740,505,000 | 12,306,691,746 | 66 |

### 3.7 මු. රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපා්රතමේන්තුවට/දිස්ත්‍රික් ලේකම් කා්රයාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන.

රු. 000

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබාදුන් අවසාන ප්‍රතිපාදනවල %ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුදල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| | අදාළ නොවේ | | | | | |

**3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය.**

රු. 000

| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2022 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 31.12.2022 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය %ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | --- | --- | --- | --- |
| 9152 | යන්ත්‍රෝපකරණ | 33,811,267.31 | --- | --- | --- |
| 9153 | ඉඩම් | --- | --- | --- | --- |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | --- | --- | --- | --- |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | --- | --- | --- | --- |
| 9160 | කෙරීගෙන යන වැඩ | 1,674.538,813 | --- | --- | --- |
| 9180 | බදු දෙන ලද වත්කම් | --- | --- | ---- | --- |

**3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව.**

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } TPD/B/DDF/2/22/40 | ඔබේ අංකය / உமது இல. / Your No. } | දිනය / திகதி / Date } 2023 මැයි 24 දින

ගණන්දීමේ නිලධාරී

සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

**ශීර්ෂය - 243 සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

ශීර්ෂය - 243 සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථාකාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමෙ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට මා ප්‍රකාශ කරමි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

2022 වර්ෂය සඳහා සැලසුම් කළ පරිදි ඉල්ලුම් කළ යුතු අග්‍රිම එකතුව රු.මිලියන 18,567.24 ක් වුවද, සමාලෝචිත වර්ෂය තුළ එකතුව රු.මිලියන 34,793.65 ක් ඉල්ලුම්කර තිබුණි. ඒ අනුව, එකතුව රු.මිලියන 16,226.42 ක් හෙවත් සියයට 87 ක් සැලසුම් කළ අග්‍රිමයට වඩා වැඩියෙන් ඉල්ලුම් කර තිබුණු බව නිරීක්ෂණය විය.

### 2.2 වියදම් කළමනාකරණය

#### 2.2.1 ඇස්තමේන්තු පිළියෙල කිරීම

පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) වැය විෂයයන් 16 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා එකතුව රු.6,523,285,207 ක ප්‍රමාණයක් සියයට 1 සිට සියයට 1424 දක්වා පරාසයකින් මු.රෙ. 66 මාරු කිරීම් මගින් ප්‍රතිපාදන වැඩි කරගෙන තිබුණි.

(ආ) වැය විෂයයන් 14 ක මූලික ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය උපයෝජනය නොවීම හේතුවෙන් එකතුව රු.6,729,319,236 ක් සියයට 1 සිට සියයට 81 දක්වා වූ පරාසයකින් මු.රෙ. 66 මගින් ප්‍රතිපාදන අඩුකර තිබුණි.

(ඇ) වැය විෂයය අංක 243-1-1-45-1501-11 අඩු ආදායම්ලාභී ජනතාවට ආහාර සුරක්ෂිතතාව සැලසීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී මූලික ඇස්තමේන්තුගත ප්‍රතිපාදන සලසාගෙන නොතිබුණු අතර, පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන මගින් රු.85,024,650 සහ මුදල් රෙගුලාසි මගින් රු. 208,034,028 ක් ලෙස එකතුව රු.293,058,678 කින් ප්‍රතිපාදන සලසාගෙන තිබුණි.

## 2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(i) විගණන පරීක්ෂාවේදී එකතුව රු.116,208 ක් වටිනාකමැති 2022 වර්ෂයට අදාළ බැරකම්, අනාවරණය වුවද, ඒවා බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ ඇතුළත් කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ii) මු.රෙ. 94(1) අනුව වෙනත් ආකාරයකට විධිවිධාන සලසා ඇති අවස්ථා හැර වාර්ෂික ඇස්තමේන්තුවල ඒ සඳහා මුදල් ප්‍රතිපාදන ඇත්නම් විනා, කිසිම දෙපාර්තමේන්තුවක් විසින් වැඩක් හෝ සේවයක් හෝ සැපයුමක් සඳහා කිසිම වියදමකට හෝ බැඳීමකට හෝ නොබැඳී සිටිය යුතු බව සඳහන් වුවද, එවැනි තහවුරු කර ගැනීමකින් තොරව වර්ෂයේ ප්‍රතිපාදන ඉක්මවා වැය විෂයයන් 04 කට අදාළ එකතුව රු.360,732 ක බැරකම් ඇති කරගෙන තිබුණ බව නිරීක්ෂණය විය.

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

2022 දෙසැම්බර් 13 දිනැති අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු මාර්ගෝපදේශයේ 7.10 ඡේදය ප්‍රකාරව, අග්‍රිම සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීමේදී අත්තිකාරම් 'බී' ගිණුමේ ගනුදෙනු, භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශන අංක SA-11 හා SA-51 අනුව සලකා බැලිය යුතු බව දන්වා තිබුණි. මේ පිළිබඳව පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) ගිණුම් ප්‍රකාශන අංක SA-11 අනුව දෙපාර්තමේන්තුව වෙනුවෙන් වෙනත් ආයතන විසින් දරන ලද වියදම වූ රු.12,356,010,353 ක් අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ රු.48,573,718,946 ක් ලෙස දක්වා තිබුණි.

(ආ) භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශන අංක SA-51 අනුව, දෙපාර්තමේන්තුව වෙත මාරු වී පැමිණෙන නිලධාරීන් වෙනුවෙන් පවරා ගත් ණය, අනෙකුත් ශීර්ෂ විසින් අත්තිකාරම් 'බී' ගිණුමට කරන ලද හර කිරීම් ලෙස රු.180,120 ක් අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ අඩු කිරීම් යටතේ දැක්විය යුතු වුවද එය රු.210,120ක් ලෙස දක්වා තිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

#### 3.1.1 කාර්යභාර ඉටු කිරීම

සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ දක්වන ලද පහත ආයතනය හා ව්‍යාපෘතිය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ක්‍රියාත්මක තත්ත්වයට පත් කිරීමට නොහැකි වී තිබුණි.

1. National Credit Guarantee Institution
2. ADB Rooftop Solar Power Generation Project (Phase II)

#### 3.1.2 මූල්‍ය සහන ණය යෝජනා ක්‍රියාත්මක කිරීම

දෙපාර්තමේන්තුවේ මැදිහත්වීම මත ක්‍රියාත්මක වන මූල්‍ය සහන ණය යෝජනා ක්‍රම 18 ට අදාළ මූල්‍ය ආයතන 17 ක් සඳහා 2022 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවෙන් ගෙවිය යුතු හිඟ පොළිය එකතුව රු.1,902,415,907 ක් වූ නමුත්, 2022 දෙසැම්බර් 31 දිනට අදාළ මූල්‍ය ආයතන වෙතින් එම ගෙවීමට ඇති පොළිය පිළිබඳ ශේෂ සනාථ කර ගැනීමක් සිදු කර නොතිබුණ අතර, එම ගෙවිය යුතු පොළී වියදම් සඳහා ප්‍රතිපාදන සලසාගෙන නොතිබීම නිසා බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශන තුළට ඇතුළත් කිරීමට නොහැකි වී තිබුණු බව නිරීක්ෂණය විය.

## 4. මානව සම්පත් කළමනාකරණය

අනුයුක්ත හා තත්‍ය කාර්ය මණ්ඩලය

2022 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු 08 ක් පැවති අතර, ඒ තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 04 ක් විය.

බී.ඔ.ඩී. ප්‍රනාන්දු
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

**04 පරිච්ඡේදය - කාර්ය සාධක දර්ශක.**

**4.1 ආයතනයේ කාර්ය සාධක දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව).**

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | 100% - 90% | 89% - 75% | 74% - 50% |
| සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රමය | 98% | --- | --- |
| කාන්තා ව්‍යවසායකත්ව මූල්‍ය ආධාර ක්‍රමය | --- | --- | 73% |
| කුඩා තේ වතු හිමියන්ගේ ණය යෝජනා ක්‍රමය | 94% | --- | --- |
| කුඩා තේ වතු හිමියන් සඳහා ජේ එෆ් පී ආර් ප්‍රදාන සංරචකය | --- | --- | 54% |
| සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය හදිසි ප්‍රතිචාර සංරචකය | 100% | --- | --- |

**05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය.**

**5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.**

| ඉලක්කය/අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0%- 49% | 50%- 74% | 75% -100% |
| **අරමුණ 02** සාගින්න නැති කර ආහාර සුරක්ෂිතභාවය සහ යහපත් පෝෂණ තත්ත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම. | 2.4) වසර 2030 වන විට තිරසර ආහාර නිෂ්පාදන පද්ධති පැවතීම තහවුරු කිරීම සහ ජෛව පද්ධති පැවතීම තහවුරු කිරීම සහ ජෛව පද්ධති පවත්වා ගැනීමට උපකාරී වන්නා වූ කාලගුණ වෙනස්වීම්වලට හැඩගැසීම සඳහා වූ ධාරිතාවන් ශක්තිමත් | 2.4.3) ඵලදායි සහ තිරසාර කෘෂිකර්මය සිදුකරන කෘෂිකාර්මික භූමි ප්‍රමාණය. | **නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය**<br>ණය සංඛ්‍යාව: 51,558<br>2022 වසරේ ගෙවන ලද පොලී සහනාධාර මුදල : රු. මිලියන 287.92<br><br>**"රන් අස්වැන්න" ණය යෝජනා ක්‍රමය**<br>ණය සංඛ්‍යාව : 7,970<br>ණය මුදල : රු. මිලියන 11,469.3<br>2022 වසරේ පොලී සහනාධාර වෙනුවෙන් නිකුත් කළ භාණ්ඩාගාර බැඳුම්කර වටිනාකම : රු. මිලියන 444.33 | | |

| | | | |
|---|---|---|---|
| | කරන්නා වූ හානිකර කාළගුණ තත්ත්වයන්, නියඟ, ගංවතුර සහ වෙනත් ආපදාවන් සහ ඉඩම් සහ පසේ ගුණාත්මක තත්ත්වයන් වර්ධනය කරන්නා වූ ඔරොත්තු දිය හැකි කෘෂිකාර්මික භාවිතයන් ක්‍රියාවට නැංවීම. | | **"ගොවි නවෝදා" ණය යෝජනා ක්‍රමය**<br>ණය සංඛ්‍යාව : 1,451<br>ණය මුදල : රු. මිලියන - 682.4<br>2022 වසරේ ගෙවන ලද පොලී සහනාධාර වෙනුවෙන් නිකුත් කළ භාණ්ඩාගාර බැදුම්කර වටිනාකම : රු. මිලියන 55.75<br><br>**ධාන්‍ය ගබඩා ඉදිකරීරීම**<br>අස්වැන්න බහුල කාලවල මිලෙහි ඇති වන පහත වැටීමෙන් ගොවීන්ට වන හානිය අවම කරමින් අස්වැන්න අඩු කාලවල දී ඉහළ මිලක් ලබා ගැනීමට අවස්ථාව ලබාදීමේ අරමුණින් වී, බඩඉරිඟු, සෝයා, තල, කව්පි, ගම්මිරිස්, රටකජු යනාදී ධාන්‍ය වර්ග ගබඩා කිරීම සඳහා අනුරාධපුර, බුත්තල, මන්නාරම, කිලිනොච්චිය සහ පොලොන්නරුව යන ප්‍රදේශවල ඉදි කරන ලද ගබඩා 05 ක මෙහෙයුම් කටයුතු අධීක්ෂණය කිරීම.<br>**රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහන**<br>මිලදීගත් වී ප්‍රමාණය - වී අලෙවි මණ්ඩලය හරහා මෙ.ටො.78,355<br>වෙළඳපලට නිකුත් කළ සහල් ප්‍රමාණය - ලංකා සතොස ඇතුළු සුපිරි වෙළඳසැල් හරහා මෙ.ටො.42,080<br>සම්පාදනය කරන ලද අරමුදල - රාජ්‍ය බැංකු මඟින් ලබාදෙන ලද ණය මුදල රු.මි.6,500<br><br>**තිරසර සංවර්ධනයක් ප්‍රවර්ධනය කිරීම**<br><br>තිරසර කෘෂිකර්මාන්තයක් සහතික කිරීම පිණිස 30% ක පරිසර හිතකාමී පොහොර හා 70% ක රසායනික පොහොර භාවිතා කොට පසේ තත්ත්වය වැඩි දියුණු කිරීමට ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඇත. |

| | | | |
|---|---|---|---|
| **අරමුණ 04** පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම. | 4.2) වසර 2030 වන විට සියලුම ගැහැණු ළමුන්ට සහ පිරිමි ළමුන්ට ගුණාත්මක වශයෙන් ඉහළ පූර්ව ළමාවිය සංවර්ධනයට, සත්කාර සේවාවන්ට සහ පූර්ව ප්‍රාථමික අධ්‍යාපනයට ප්‍රවේශ වීමේ අවස්ථාව පැවතීම හා එමගින් ඔවුන් ප්‍රාථමික අධ්‍යාපනයට සුදානම්ව සිටින බව තහවුරු කිරීම. | 4.2.1) ස්ත්‍රී පුරුෂ භාවය අනුව සෞඛ්‍යමය, ඉගෙනුම් සහ මනෝවිද්‍යාත්මක අංශයන්ගෙන් යහපත් සංවර්ධන මාර්ගයකට අවතීර්ණව සිටින වයස අවු. 5 ට අඩු ළමුන්ගේ ප්‍රමාණය | **"සිගිති පාසල" ණය යෝජනා ක්‍රමය**<br>ණය සංඛ්‍යාව : 62<br>ණය මුදල : රු. මිලියන 63.4<br>2022 වසරේ ගෙවන ලද පොලී සහනාධාර වෙනුවෙන් නිකුත් කළ භාණ්ඩාගාර බැදුම්කර වටිනාකම : රු. මිලියන 2.23<br><br>**"රැකවරන" ණය යෝජනා ක්‍රමය**<br>ණය සංඛ්‍යාව : 9<br>ණය මුදල : රු. මිලියන 44.4<br>2022 වසරේ ගෙවන ලද පොලී සහනාධාර වෙනුවෙන් නිකුත් කළ භාණ්ඩාගාර බැදුම්කර වටිනාකම : රු. මිලියන 3.67 |
| | 4.7) වසර 2030 වන විට ඉගෙනුම ලබන සියලුම දෙනා තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ දැනුම සහ කුසලතාවන් ලබාගෙන සිටීම, එයට තිරසර සංවර්ධනය පිළිබඳ අධ්‍යාපනය සහ තිරිසර ජීවන රටාවන්, මානව අයිතිවාසිකම්, සාමය සහ ප්‍රචණ්ඩත්වයෙන් තොර සංස්තෘතියක් ප්‍රවර්ධනය කිරීම, ගෝලීය පුරවැසිභාවය සහ සංස්කෘතික විවිධත්වය ඇගයීම සහ තිරසර සංවර්ධනයට සංස්කෘතිකමය වශයෙන් දායක වීම ඇතුලත් වේ. | 4.7.1) ගෝලීය පුරවැසිභාවය පිළිබඳ ඉගෙනුම II. ස්ත්‍රී පුරුෂ සමාජ භාවය සහ මානව හිමිකම් (අ) ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තීන් (ආ) විෂය මාලාවන් (ඇ) ගුරු අධ්‍යාපනය සහ (ඈ) ශිෂ්‍ය ඇගයීම් යන සියළු මට්ටම්වල දී ප්‍රවාහානුගතව පැවතීම ඇතුළත් තිරසර සංවර්ධනය සඳහා වන ඉගෙනුම. | **"මගේ අනාගතය" ණය යෝජනා ක්‍රමය**<br>ණය සංඛ්‍යාව : 729<br>ණය මුදල : රු. මිලියන 650.5<br>2022 වසරේ ගෙවන ලද පොලී සහනාධාර වෙනුවෙන් නිකුත් කළ භාණ්ඩාගාර බැදුම්කර වටිනාකම : රු. මිලියන 54.44<br><br>**"ඇරඹුම" ණය යෝජනා ක්‍රමය**<br>ණය සංඛ්‍යාව : 175<br>ණය මුදල : රු. මිලියන 230.99<br>2022 වසරේ ගෙවන ලද පොලී සහනාධාර වෙනුවෙන් නිකුත් කළ භාණ්ඩාගාර බැදුම්කර වටිනාකම : රු. මිලියන 17.17 |
| **අරමුණ 5** ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ළඟාකර සියලු කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම. | 5.1) කාන්තාවන්ට හා ගැහැණු ළමුන්ට එරෙහිව සියලු ස්ථානයන්හි සිදුවන්නා වූ සියලුම ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීම. | 5.1.1) ස්ත්‍රී පුරුෂ භාවයට අදාළව සමානාත්මතාවය සහ වෙනස්කොට නොසැලකීම් ප්‍රවර්ධනය බලාත්මක කිරීම සහ අධීක්ෂණය පිණිස වන නෛතික | **කාන්තා ව්‍යවසායකත්ව මූල්‍ය ආධාර ණය යෝජනා ක්‍රමය**<br>ණය සංඛ්‍යාව : 343<br>ණය මුදල : රු. මිලියන 251.10 |

| | | | |
|---|---|---|---|
| | | රාමුවක් පවත්නේද නැද්ද යන්න. | |
| **අරමුණ 7**<br>සියල්ලන් සඳහා දැරිය හැකි, විශ්වසනීය, තිරසර සහ නවීන බලශක්ති සැපයුම සහතික කිරීම. | 7. ආ) වසර 2030 වන විට විශේෂයෙන්ම අවම වශයෙන් සංවර්ධනය වූ රටවල කුඩා දිවයින් රාජ්‍යයන්හි සහ අනෙකුත් රටවල දේශ සීමාවන්ගෙන් ආවරණය වූ සංවර්ධනය වෙමින් පවත්නා රටවල් ද ඇතුලත්ව සියලුම සංවර්ධනය වන රටවල ඔවුන්ගේ වැඩසටහන් සැලසුම් වලට අනුකූලව නවීන සහ තිරසර බලශක්ති සේවා සැපයීම සඳහා යටතල පහසුකම් ව්‍යාප්ත කිරීම සහ තාක්ෂණය වැඩි දියුණු කරීම. | 7. ආ 1) දළ දේශීය නිෂ්පාදනයේ සහ තිරසර සංවර්ධන සේවා සඳහා වන යටිතල පහසුකම් සහ තාක්ෂණය පිණිස වන මූල්‍ය හුවමාරුව පිණිස වන සෘජු විදේශ ආයෝජන ප්‍රමාණයට අනුපාතව බලශක්ති කාර්යක්ෂමතාවය සඳහා වන ආයෝජන. | **"රිවි බල සවිය" ණය යෝජනා ක්‍රමය**<br>ණය සංඛ්‍යාව : 453<br>ණය මුදල : රු. මිලියන 157.6<br>2022 වසරේ ගෙවන ලද පොලී සහනාධාර වෙනුවෙන් නිකුත් කළ භාණ්ඩාගාර බැදුම්කර වටිනාකම : රු. මිලියන 7.31 |
| **අරමුණ 8**<br>සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම. | 8.3) ඵලදායී ක්‍රියාකාරකම්වලට, සුනිසි රැකියා අවස්ථාවන්ට, ව්‍යවසායකත්වයට සහ නිර්මාණශීලී භාවයට සහය දක්වන්නා වූ සංවර්ධනාත්මක දිශානතියකින් යුත් ප්‍රතිපත්තියෙන් ප්‍රවර්ධනය කිරීම මූල්‍ය සේවාවන්ට ප්‍රවේශවීමට අවස්ථාව සලසමින් ක්ෂුද්‍ර, කුඩා පරිමාණ සහ මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායන් පිහිටුවීම් සහ සංවර්ධනය කිරීම් දිරි ගැන්වීම. | 8.3.1) ස්ත්‍රී පුරුෂ භාවය අනුව, කෘෂිකාර්මික නොවන සේවා නියුක්තියේ නොවිධිමත් සේවා නියුක්ති ප්‍රමාණය. | **සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රමය**<br>ණය සංඛ්‍යාව : 692<br>ණය මුදල : රු. මිලියන 5,448<br><br>**"ජය ඉසුර" ණය යෝජනා ක්‍රමය**<br>ණය සංඛ්‍යාව : 1,000<br>ණය මුදල : රු. මිලියන 21,357.4<br>2022 වසරේ ගෙවන ලද පොලී සහනාධාර වෙනුවෙන් නිකුත් කළ භාණ්ඩාගාර බැදුම්කර වටිනාකම : රු. මිලියන 1,653.22<br><br>**"හරිත ණය" යෝජනා ක්‍රමය**<br>ණය සංඛ්‍යාව : 242<br>ණය මුදල : රු. මිලියන 791.5<br>2022 වසරේ ගෙවන ලද පොලී සහනාධාර වෙනුවෙන් නිකුත් කළ භාණ්ඩාගාර බැදුම්කර වටිනාකම : රු. මිලියන 58.48<br><br>**"දිරි සවිය" ණය යෝජනා ක්‍රමය**<br>ණය සංඛ්‍යාව : 572 |

| | | | |
|---|---|---|---|
| | | | ණය මුදල : රු. මිලියන 4,13.3<br>2022 වසරේ ගෙවන ලද පොලී සහනාධාර වෙනුවෙන් නිකුත් කළ භාණ්ඩාගාර බැදුම්කර වටිනාකම : රු. මිලියන 22.15<br><br>**"රිය ශක්ති" ණය යෝජනා ක්‍රමය**<br>ණය සංඛ්‍යාව : 178<br>ණය මුදල : රු. මිලියන 613.8<br>2022 වසරේ ගෙවන ලද පොලී සහනාධාර වෙනුවෙන් නිකුත් කළ භාණ්ඩාගාර බැදුම්කර වටිනාකම : රු. මිලියන 93.83<br><br>**"මාධ්‍ය අරුණ" ණය යෝජනා ක්‍රමය**<br>ණය සංඛ්‍යාව : 258<br>ණය මුදල : රු. මිලියන 76.9<br>2022 වසරේ ගෙවන ලද පොලී සහනාධාර වෙනුවෙන් නිකුත් කළ භාණ්ඩාගාර බැදුම්කර වටිනාකම : රු. මිලියන 5.45<br><br>**"සංචාරක පොඩ්ඩෝ" ණය යෝජනා ක්‍රමය**<br>ණය සංඛ්‍යාව : 1,198<br>ණය මුදල : රු. මිලියන 538.46<br>2022 වසරේ ගෙවන ලද පොලී සහනාධාර වෙනුවෙන් නිකුත් කළ භාණ්ඩාගාර බැදුම්කර වටිනාකම : රු. මිලියන 3.36<br><br>**"සිටි රයිඩ්" ණය යෝජනා ක්‍රමය**<br>ණය සංඛ්‍යාව : 8<br>ණය මුදල : රු. මිලියන 52.1<br>2022 වසරේ ගෙවන ලද පොලී සහනාධාර වෙනුවෙන් නිකුත් කළ භාණ්ඩාගාර බැදුම්කර වටිනාකම : රු. මිලියන 2.08 |
| **අරමුණ 10**<br>රටවල් අතර ඇති අසමානතාවයන් අවම කිරීම | 10.1) යෝග්‍ය ප්‍රතිපත්ති විශේෂයෙන් මූල්‍ය, වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිපත්ති ප්‍රචලිත කිරීමෙන් ක්‍රමාණුකූලව සමාන අවස්ථාවන් සඳහා ප්‍රවේශයක් ඇති කරීම. | 10.1.1) මූල්‍ය ප්‍රතිපත්තිවල බලපෑම නැවත බෙදා දැක්වීම. | හෙක්ටයාර් දෙකට අඩු ඉඩම් හිමි කුඩා පරිමාණ වී ගොවීන් රැකගනු පිණිස 2022 වසරේ දී පොහොර සහනාධාරය ලබාදෙන ලදී. එසේම, MOP පොහොර මිල දී ගැනීමට හෙක්ටයාර් එකක රු. 10,000 ගණනෙ හෙක්ටයාර් 2 ක් සඳහා අවශ්‍ය මුදල් ගොවීන්ගේ ගිණුම් වෙත සෘජුවම |

| | | | |
|---|---|---|---|
| | | | තැන්පත් කරන ලදී. |
| **අරමුණ 11**<br>නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම | 11.1) 2030 වන විට සියලුම දෙනාට ප්‍රමාණවත් ආරක්ෂාකාරී සහ අඩු මිලට ලබා ගත හැකි නිවාස සහ මූලික සේවාවන් වෙත ප්‍රවේශය තහවුරු කිරීම සහ පැල්පත් නිවාස වැඩි දියුණු කිරීම. | 11.1.1) පැල්පත්, අවිධිමත් ජනාවාස හෝ ප්‍රමාණවත් නොවන නිවාස පහසුකම් යටතේ ජීවත් වන නාගරික ජනගහනයේ ප්‍රමාණය. | **"සොඳුරු පියස" ණය යෝජනා ක්‍රමය**<br>ණය සංඛ්‍යාව : 14,834<br>ණය මුදල රු. මිලියන : 2,958.3<br>2022 වසරේ ගෙවන ලද පොලී සහනාධාර වෙනුවෙන් නිකුත් කළ භාණ්ඩාගාර බැඳුම්කර වටිනාකම : රු. මිලියන 152.88<br><br>**"හෝම් ස්වීට් හෝම්" ණය යෝජනා ක්‍රමය :**<br>ණය සංඛ්‍යාව: 1,282<br>ණය මුදල රු. මිලියන : 4,585.2<br>2022 වසරේ ගෙවන ලද පොලී සහනාධාර වෙනුවෙන් නිකුත් කළ භාණ්ඩාගාර බැඳුම්කර වටිනාකම : රු. මිලියන 301.89<br><br>**"සිහින මාලිගා" ණය යෝජනා ක්‍රමය**<br>ණය සංඛ්‍යාව : 247<br>ණය මුදල රු. මිලියන : 1,332.5<br>2022 වසරේ ගෙවන ලද පොලී සහනාධාර වෙනුවෙන් නිකුත් කළ භාණ්ඩාගාර බැඳුම්කර වටිනාකම : රු. මිලියන 72.76 |
| **අරමුණ 13**<br>දේශගුණික විපර්යාස හා එහි බලපෑම මැඩලීම සඳහා ඉක්මන් ක්‍රියාමාර්ග ගැනීම. | 13.1) ජාතික ප්‍රතිපත්ති, උපායමාර්ග හා සැලසුම් කිරීමේ දී දේශගුණික වෙනස්වීම් සඳහා බලපාන සාධක ඇතුලත් කිරීම. | 13.1.1) වසරක් තුල දී විමෝචනය වන මුළු හරිතාගාර වායු ප්‍රමාණය. | රසායනික පොහොර භාවිතය අඩුවීම හරිතාගාර වායු මෝචනය අඩුවීමට බලපෑමක් වී ඇත. |

**5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න**

**පසුබිම**

ආර්ථික සංවර්ධනයේ දී රටක් සතු ස්වභාවික සම්පත් වර්තමාන පරම්පරාව විසින් ප්‍රශස්ත ලෙස හා මනා කළමනාකාරීත්වයකින් යුක්තව භාවිතා කිරීම මගින් අනාගත පරම්පරාවට ද එම සම්පත් උරුම කර දීම තිරසර සංවර්ධනයේ මුඛ්‍ය පරමාර්ථය වේ. එවන් අරමුණක් පෙරදැරි කර ගනිමින් 2015 වසරේ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මගින් සිය සාමාජික රටවල් 193 විසින් ක්ෂේත්‍ර 17 ක් ආවරණය වන පරිදි 2030 වසර වන විට සාක්ෂාත් කර ගත යුතු තිරසර සංවර්ධන අභිමතාර්ථ 17 ක් හඳුන්වාදෙන ලදී. ඒ අනුව, මානව, සමාජ, ආර්ථික හා පාරිසරික යන ප්‍රධාන කුලුණු හතර සම්බන්ධ කරමින් පාරිසරික තිරසරභාවය, සමාජ තිරසරභාවය සහ ආර්ථික සංවර්ධනය යන අංශ ඔස්සේ අගය කරනු ලබන තිරසාර සංවර්ධනයක් කරා ආර්ථිකයන් මෙහෙයවීම මෙහි ප්‍රමුඛ පරමාර්ථය වේ. මෙකී තිරසාර සංවර්ධන අභිමතාර්ථයන් සහ ඉලක්ක

වසර 2030 දී ළඟාකර ගැනීම සඳහා ශ්‍රී ලංකාව ද විවිධ ක්‍රියාමාර්ග ගෙන ඇති අතර ඒ සඳහා රාජ්‍ය අංශයේ මෙන්ම රාජ්‍ය නොවන සංවිධාන හරහා මෙන්ම ජාත්‍යන්තර සංවිධාන මත පදනම්ව කටයුතු කරනු ලැබේ.

මෙම තිරසර සංවර්ධන අභිමතාර්ථවල ප්‍රමුඛතම හා පළමු පරමාර්ථය වන "සියළු ආකාරයේ දිළිඳු බව, සියළු තැන්හිම දුරු කිරීම" සඳහා නිෂ්පාදනය වැඩිකිරීම වෙනුවෙන් ආයෝජනය වේගවත් කිරීමටත්, ඒ සඳහා ප්‍රමුඛත්වය අවශ්‍ය අංශ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීමත්, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳව වැඩි නැඹුරුවක් ලබාදෙමින් සංවර්ධන උපායමාර්ග මෙහෙයවීමත් වැදගත් වේ. ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේ දී වැදගත් උපායමාර්ගික අංශයක් වන ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයේ වැදගත්කම හඳුනාගනිමින් ඒ සඳහා අවශ්‍ය රාජ්‍ය යාන්ත්‍රණයේ දායකත්වය ලබාදීමේ අරමුණ පෙරදැරිකර ගනිමින් සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය ඉලක්ක කරගනිමින් වැඩසටහන් රාශියක් ක්‍රියාවට නංවා ඇත. එම වැඩසටහන් අතර සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රමය හා කොවිඩ් වසංගතය නිසා බලපෑමට ලක් වූ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා ලබාදෙන කාරක ප්‍රාග්ධන ණය යෝජනා ක්‍රමය ප්‍රමුඛ වැඩසටහන් වේ.

**සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය**

2016 වසරේ දී ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ ආරම්භ කළ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රමය මඟින් ඇ.ඩො. මිලියන 175 ක් එම ව්‍යාපාරයන් හි ආයෝජන ඉහළ නැංවීම සඳහා ලබා දෙමින් 2020 වසර වන විට සාර්ථකව අවසන් කරන ලදී. එහි ඊළඟ අදියර 2020 වසරේ දී ආරම්භ කරන ලද අතර මෙම අදියර යටතේ ආසියානු සංවර්ධන බැංකුව විසින් ඇ. ඩො. මිලියන 165 ක් ලබා දෙන ලදී. එයින් පිළිවලින්, ඇ. ඩො. මිලියන 100 ක් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය හදිසි ප්‍රතිචාර සංරචකයටත්, ඇ. ඩො. මිලියන 45 ක් දැනට ක්‍රියාත්මක සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රමය ඉදිරියට ගෙන යාමටත්, ඇ. ඩො. මිලියන 20 ක් කුඩා තේ වතු හිමියන්ට තේ නව රෝපණය, නැවත වගා කිරීම, පාළු සිටුවීම, බිම් සැකසීම සහ යාන්ත්‍රීකරණය සඳහා පහසුකම් සැපයීමට නියමු ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කරන ණය යෝජනා ක්‍රමයක් ලෙස ක්‍රියාත්මක කිරීමටත් වෙන් කරන ලදී. ඒ අනුව, 2022 වසර අවසන් වන විට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රමය යටතේ ව්‍යවසායකයින් 692 ක් අතරේ රුපියල් මිලියන 5,700 ක මුදලක් ආයෝජන ණය වශයෙන් ලබාදෙන ලදී. එම ණය මුදලින් රු. මිලියන 251 ක් කාන්තා ව්‍යවසායකයින් 343 දෙනෙක් අතරේ ආයෝජන ණය සමඟ මුසු කරමින් ලබාදෙන ලදී,

එපමණක් නොව, කොවිඩ් - 19 වෛරසය පැතිර යාමත් සමඟ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාව්‍යසායකයින්ගේ ක්ෂණික මූල්‍ය අවශ්‍යතා වැඩිවීමත්, ව්‍යාපාර බිඳවැටීම තුළින් ඇති වූ අහිතකර බලපෑම අවම කර සේවකයින්ගේ රැකී රක්ෂා සුරක්ෂිත කර ගැනීමත්, කඩාවැටුනු සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් නැවත සවිබල ගැන්වීම සඳහා එම ව්‍යාපාර වෙත කෙටිකාලීන කාරක ප්‍රාග්ධන ණය ලබාදීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව විසින් "සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය හදිසි ප්‍රතිචාර සංරචකය," (SME Emergency Response Component) යටතේ ඇ.ඩො. මිලියන 100 ක් එනම් රු. මිලියන 19,348 ක මුදලක් ලබාදෙන ලදී. එලෙස ප්‍රතිපාදිත මුළු මුදල 2022 වසර අවසන් වන විට සහභාගීත්ව මූල්‍ය ආයතන 10 ක් විසින් ව්‍යවසායකයින් 3,842 ක් අතරේ ලබාදෙමින් සාර්ථකව උපයෝජනය කර අවසන් කරන ලදී. එලෙස ලබාදෙන ලද ණයවලින් සියයට 53 ක් ම ඇප සුරැකුම් රහිත ණය වශයෙන් ලබාදීම සුවිශේෂී තත්ත්වයකි.

තවද, තේ කර්මාන්තය ලංකාවේ ප්‍රමුඛතම විදේශ ආදායම් උත්පාදන මාර්ගයක් වන බැවින් හා ඒ සඳහා කුඩා තේ වතු හිමියන් විසින් දක්වන දායකත්වය ඉහළ නැංවීම සඳහා කුඩා තේ වතු හිමියන්ට තේ නව රෝපණය, නැවත වගා කිරීම, පැළ සිටුවීම, බිම් සැකසීම සහ යාන්ත්‍රීකරණය සඳහා පහසුකම් සැපයීමට ක්‍රියාත්මක කරනු ලබන නියමු ව්‍යාපෘතිය වෙනුවෙන් ආසියානු සංවර්ධන බැංකුව විසින් ඇ. ඩො. මිලියන 20 ක් ලබා දෙන ලදි. තවද, තේ නව රෝපණය හා තේ නැවත වගාව වෙනුවෙන් ණය ලබාගන්නන්ට ඔවුන් දිරිමත් කිරීමේ අරමුණින් අදාල ණය මුදලින් සියයට 20 ක් නැවත නොගෙවිය යුතු ප්‍රදානයක් ලෙස ආයෝජන ණය සමග මුසුකර ලබාදෙන ලදී. කුඩා තේ වතු හිමියන් සඳහා වන ණය යෝජනාක්‍රමය යටතේ රු. මිලියන 1,515ක් කුඩා තේ වතු හිමියන් 982 දෙනෙකු වෙත ලබා දෙන ලදී. එම මුදලින්, කුඩා තේ වතු හිමියන් 660 දෙනෙකු වෙත තේ අලුතින් වගා කිරීම හා නැවත වගා කිරීම වෙනුවෙන් රු. මිලියන 86 ක් වටිනා දිළිඳුකම අඩු කිරීම සඳහා වන ජපන් අරමුදල් ප්‍රදානය (JFPR) ලබා දී තිබේ. තවද, එම රු. මිලියන 1,515 අතරින් සියයට 56 ක ප්‍රතිශතයක් තේ නැවත වගා කිරීම හා සියයට 31ක ප්‍රතිශතයක් තේ අලුතින් වගා කිරීම සඳහා ලබා දී තිබේ.

**ආහාර සුරක්ෂිතතාව, පෝෂණය හා තිරසර කෘෂිකර්මාන්තය**

"ආහාර සුරක්ෂිතතාව හා ඉහළ පෝෂණයක් අත්පත්කර ගැනීම සහ තිරසාර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම" තිරසර සංවර්ධන අභිමතාර්ථවල තවත් එක් වැදගත් පරමාර්ථයක් වේ. ඒ වෙනුවෙන් කෘෂි අංශයේ ආයෝජනය ප්‍රවර්ධනය කිරීම හා නිෂ්පාදන ගුණත්වය ඉහළ නැංවීම අත්‍යාවශ්‍ය වේ. එමගින් සාගින්නෙන් පෙළෙන ජනතාව අවම කර ආහාර සුරක්ෂිතතාව හා වස විසෙන් තොර ඉහළ පෝෂණයෙන් යුත් ආහාර වේලක් අත්පත් කරගැනීමට අවකාශ හිමිවන අතර දරිද්‍රතාවෙන් පෙළෙන සහ අවදානමට ලක් වී තිබෙන ජනතාවට පෝෂණයෙන් යුත් ප්‍රමාණවත් ආහාර වසර පුරා ලබාගැනීමට හැකි බව තහවුරු කිරීමට හැකි වනු ඇත. ඒ අනුව, සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් වී මිල දී ගැනීමේ වැඩසටහන හා රජයේ පොහොර ලබාදීමේ වැඩසටහන ඵලදායී ලෙස ක්‍රියාවට නැංවීම තුළින් මෙම අරමුණ වෙනුවෙන් සක්‍රීයව දායකත්වය ලබාදෙනු ලබයි.

පූර්ණ වශයෙන්ම කාබනික පොහොර භාවිතයට යොමුවීමේ රජයේ ප්‍රතිපත්තිය සමග සැලකිය යුතු මට්ටමේ අස්වැන්න අඩුවීමක් 2021 වර්ෂයේ දැකගත හැකි විය. විදේශ විනිමය ගැටළුව හේතුවෙන්, 2021/22 මහ කන්නයේදී මෙන්ම, 2022 යල කන්නයේ දී ද රසායනික පොහොර ප්‍රමාණවත් පරිදි ලබාදීමට නොහැකි විය. මෙය රට තුළ ආහාර සුරක්ෂිතතාවය අවදානමකට ලක් කිරීමක් විය. කෙසේවෙතත්, ඉන්දියානු ණය ආධාර පහසුකම යටතේ යූරියා මෙ.ටො. 65,000ක් 2022 යල කන්නය සඳහා ලබාදීමට රජය සමත් විය. තවද, ලෝක බැංකුවේ මූල්‍ය ආධාර මත යූරියා පොහොර මෙ. ටො. 105,000ක් හා ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍යාධාර මත මියුරේට් ඔෆ් පොටෑෂ් පොහොර මෙ.ටො. 40,000ක් ආනයනය කරන ලදී. මෙලෙස ආනයනය කරන ලද පොහොර හා දේශීය පරිසර හිතකාමී පොහොර නිෂ්පාදනත් නිසා 2022 වසරේ දී වී නිෂ්පාදනය සඳහා අවශ්‍ය පොහොර සැපයුම කළමනාකරනය කර ගැනීමට හැකි විය.

කුකුළු ආහාර සඳහා ප්‍රධාන අමුද්‍රව්‍ය වන බඩඉරිඟු ආනයනය සඳහා අවසර හිමි වුවද, දේශීය වෙළඳපොල තුළ විදේශ විනිමය හිඟකම හේතුවෙන් සත්ත්ව ආහාර නිෂ්පාදනයින් හා ආනයනයකරුවන්ට 2022 වර්ෂය සඳහා අවශ්‍ය බඩඉරිඟු ප්‍රමාණය ආනයනය කළ නොහැකි විය. මෙම හේතුව නිසා, බිත්තර සහ කුකුළු මස්වල මිල ගණන් සැලකිය යුතු මුදලකින් ඉහළ යන ලදී. තවද, රටේ ජනතාවගේ ප්‍රෝටීන් අවශ්‍යතාව කුකුළු මස්වලින් මෙන්ම මාළුවලින් ද කළමනාකරණය

කර ගතහැකි බවට නිරීක්ෂණය විය. මෙලෙස කුකුළු මස් නිෂ්පාදන මිල ඉහළයාම හේතුවෙන් ජනගහනයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් කුකුළු මස් නිෂ්පාදන පරිභෝජනය කිරීමේ හැකියාව මග හැරී යන ලදී. මෙම ගැටළුව පිළිබඳව සලකා බලා පාරිභෝගික සේවා අධිකාරිය විසින් බිත්තර සඳහා උපරිම සිල්ලර මිලක් නියම කිරීමටත් බිත්තර ආනයනකර බෙදාහැරීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලදී. තවද, 2022/23 මහ කන්නයේ දී බඩඉරිඟු අස්වැන්න සැලකියයුතු වැඩිවීමක් අපේක්ෂා කරනු ලබයි.

2020 වසරේ සිට පැවති කොවිඩ් වසංගත තත්ත්වය හා නියමිත වේලාවට කෘෂිකාර්මික පොහොර සහ ඉන්ධන ලබා ගැනීමට නොහැකි වීම මත 2022 වර්ෂයේ මෙරට වී නිෂ්පාදනය අනෙකුත් වර්ෂවලට සාපේක්ෂව අඩු මට්ටමක පැවතුණි. එබැවින්, මෙවර රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහන වී අලෙවි මණ්ඩලය හරහා පමණක් ක්‍රියාත්මක කරන ලද අතර බැංකු හරහා සපයන ලද ණය අරමුදල් රු.මි. 6,500ක් භාවිතා කරමින් වී මෙ.ටො. 78,355ක් මිලදී ගන්නා ලදී. මේ යටතේ සහල් මෙ.ටො. 42,080ක් පමණ දිවයින පුරා පිහිටි ලංකා සතොස ඇතුළු වෙළඳසැල් හරහා උපරිම සිල්ලර මිල යටතේ ජනතාවට ලබා ගැනීම සඳහා අවස්ථාව සලසා දෙන ලදී. විශේෂයෙන්ම සිංහල හා හින්දු අළුත් අවුරුදු සමයේදී සහල් සඳහා වෙළඳපල තුළ පැවති ඉහළ මිල හමුවේ මෙමඟින් පාරිභෝගික ජනතාවට සහනයක් ලබාදීමට හැකිවිය.

2022 වර්ෂයේදී වෙළඳපොළෙහි අඛණ්ඩව සහල් මිල ඉහළ යාමේ ප්‍රවණතාවය සැලකිල්ලට ගනිමින්, වෙළඳපොළ තුළ දැරිය හැකි මිල මට්ටමකට සහල් සුලබතාව සහතික කිරීම සඳහා 2021 වර්ෂයේ ආරම්භකළ සහල් ආනයනය 2022 වර්ෂයේදී ද අඛණ්ඩව සිදු කිරීමට රජය පියවර ගනු ලැබීය. ඒ අනුව, 2021 නොවැම්බර් 2 දින සිට 2023 පෙබරවාරි 15 දින දක්වා රාජ්‍ය ආයතන සහ පෞද්ගලික අංශයේ ආයතන යන දෙඅංශයෙන්ම සහල් මෙ.ටො. 922,620ක් ආනයනය කර ඇත. මෙම ක්‍රියාවලියේ දී රජය විසින් 2022 ජනවාරි මස රු.මි. 1,350 ක හා 2022 පෙබරවාරි මස රු.මි. 5,135 ක වටිනාකමින් යුත් භාණ්ඩාගාර ඇපකර මහජන බැංකුව වෙත නිකුත් කරමින් ඉන්දියාවෙන් සහල් ආනයනය කිරීම සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ නීතිගත සංස්ථාවට පහසුකම් සපයන ලදී.

## 06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

### 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය.

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු/(අතිරික්ත)** |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 21 | 17 | 04 |
| තෘතීයික | 01 | 01 | 0 |
| ද්විතීයික | 23 | 22 | 01 |
| ප්‍රාථමික | 12 | 09 | 03 |

**6.2 **ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපෑනු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.**

ඇබැර්තු පවතින තනතුරෙහි රාජකාරි ආවරණ කටයුතු අනෙකුත් නිලධාරීන් විසින් සිදු කරනු ලබයි.

**6.3 මානව සම්පත් සංවර්ධනය**

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය (රු.'000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම/ලබාගත් දැනුම* |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධනය ශක්තිමත් කිරීම, පවත්වාගෙනයාම හා ඇගයීම | 02 | දින 04 | --- | --- | දේශීය | රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනයන්හි නිලධාරීන් වෙනුවෙන් ඔවුන්ගේ ධාරිතා සංවර්ධනය වෙනුවෙන් Evaluation Association මගින් පවත්වනු ලැබූ සංවර්ධන ක්‍රියාදාමයන්ගේ මැදිහත්වීම්වල ඇගයීම් කරන ආකාරය සම්බන්ධයෙන් දැනුමක් ලබා ගන්නා ලදී. |
| නවක නිලධාරීන් සඳහා කාර්යාල ක්‍රමවේද හා ආචාර ධර්ම පිළිබඳ වැඩමුළුව. | 01 | දින 02 | 7,500/- | --- | දේශීය | කාර්යාල ක්‍රමවේද හා ආචාර ධර්ම පිළිබඳ අවබෝධයක් ලබා ගන්නා ලදී. |
| සංවර්ධන නිලධාරීන්ගේ හා කළමනාකරන සේවා නිලධාරීන්ගේ කුසලතා සංවර්ධනය. | 01 | දින 02 | 10,000/- | --- | දේශීය | කුසලතා සංවර්ධනය කර ගන්නා ආකාරය පිළිබඳ අවබෝධයක් ලබා ගන්නා ලදී. |

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය (රු.'000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම/ලබාගත් දැනුම* |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| නිවාඩු භාර නිලධාරීන්ගේ කාර්යභාරය හා වගකීම. | 01 | දින 01 | 5,000/- | --- | දේශීය | ආයතන සංග්‍රහයේ 12 වන පරිච්ඡේදයේ ඇති නිවාඩු පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. |
| ගිණුම් ලිපිකරුගේ කාර්යභාරය හා වගකීම. | 01 | දින 01 | 5,000/- | --- | දේශීය | ගිණුම් කරණයේ ප්‍රායෝගික භාවිතය පිළිබඳ මනා අවබෝධයක් ලබා ගන්නා ලදී |
| ආයතන සංග්‍රහයේ විධි විධාන හා පටිපාටික රීති භාවිතය පිළිබඳ. | 01 | දින 02 | 7,500/- | --- | දේශීය | කාර්යාල කටයුතු සිදු කිරීමේ දී ආයතන සංග්‍රහයේ විධි විධාන හා පටිපාටික රීත අනුගමනය කරමින් කටයුතු කරන ආකාරය පිළිබඳව දැනුවත් වන ලදී. |
| සහායක කාර්ය මණ්ඩල සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය. | 01 | දින 02 | 10,000/- | --- | දේශීය | ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී. |
| රියදුරන් සහ කාර්යාල කාර්ය සහයක සඳහා විනය හා කාර්යාලීය ආචාර විධි. | 01 | දින 02 | 8,500/- | --- | දේශීය | විනය හා කාර්යාලීය ආචාර විධි සම්බන්ධ පුහුණුවක් ලබා ගන්නා ලදී. |

* ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන්නේ කෙසේද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම් | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1.** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාළ නොවේ | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.6 | වෙනත් | අනුකූල වේ | | |
| **2.** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු. රෙ. 445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛණ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලින කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **3.** | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු. රෙ.135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය ගණකාධිකාරීවරයාගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| **4.** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරපත් කර තිබීම | අනුකූල වේ | | |
| **5.** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරා විසින් නියම කොට ඇති දිනට සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම. | අනුකූල වේ | | |
| **6.** | **අභ්‍යන්තර විගණන** | | | |
| 6.1 | මු. රෙ. 134(2) DMA/1 -2019 අනුව වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම. | අනුකූල වේ | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමණාකරන විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| **7.** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛන 1-2019 අනුව, අවම වශයෙන් විගණන කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම. | අනුකූල වේ | | |
| **8.** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ජේදය අනුව වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ජේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධි විදාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම. | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනයට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමික්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛනයේ සඳහන් කාලය | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | තුළ සිදුකොට තිබීම. | | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු. රෙ. 772 අනුව සිදු කිරීම. | අනුකූල වේ | | |
| **9.** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම. | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම. | අදාළ නොවේ | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු. රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම. | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් වන විධි විධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම. | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව බදු, වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | අනුකූල වේ | | |
| **10.** | **ගිණුම් කලමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම. | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල වේ | | |
| **11.** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම. | අනුකූල වේ | | |
| 11.2 | මු. රෙ. 94(1) ප්‍රකාරව සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම. | අනුකූල වේ | | |
| **12.** | **රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්වලට අනුකූල වීම | අනුකූල වේ | | |
| 12.2 | හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම. | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම. | අනුකූල වේ | | |
| **13.** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු. රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම. | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම් යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| **14.** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම. | අනුකූල වේ | | |
| 14.2 | මු. රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම. | අනුකූල වේ | | |
| 14.3 | මු. රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම. | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුම් ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම. | අනුකූල වේ | | |
| **15.** | **ආදායම් ගිණුම්** | | | |
| 15.1 | අදාළ රෙගුලාසිවලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම. | අනුකූල වේ | | |
| 15.2 | රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම. | අනුකූල වේ | | |
| 15.3 | මු. රෙ. 176 හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| **16.** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලයිස්තු ලිඛිතව ලබා දී තිබීම. | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 16.3 | 20.09.2017 දිනැති DMA චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත්කර තිබීම. | අනුකූල වේ | | |
| **17.** | **මහජනයා වෙත තොරතුරු ලබාදීම** | | | |
| 17.1 | තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනතාවගේ ප්‍රසංශා/චෝදනා පල කිරීමට පහසුකම් සලකා තිබීම. | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| **18.** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/20/18 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම. | අනුකූල වේ | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතනය විසින් | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | ක්‍රමවේදයක් සකස් කොට තිබීම. | | | |
| **19.** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම.** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම. | අනුකූල වේ | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම. | අනුකූල වේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍ර ලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබිම. | අනුකූල වේ | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම. | අනුකූල වේ | | |
| **20.** | **විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂය සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම. | අනුකූල වේ | | |